# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1825/13 - 2013 අගෝස්තු මස 27 වැනි අඟහරුවාදා - 2013.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: පු/කරු/2010/058.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාජවන්නි පත්තුව සුළු කොට්ඨාසයේ, රනවරාපිටිය ගමේ, පිහිටි දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද 2010.04.30 දින දරන අවසාන පිඹුරේ අංකය FTP 22 හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.1540ක් පමණ වූ නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි පහක් (05) :

1. කැබලි අංක 7447
ඉඩමේ නම: රනවරාපිටිය මූකලාන; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: (අනවසරකරු: එස්. ඒ. ඩී. නිදර්ශිකා, අංක 21 1/2 සැතැපුම් කනුව, සාලියවැව හංදිය); ප්‍රමාණය: හෙක් 0.0006.

2. කැබලි අංක 7448
ඉඩමේ නම: රනවරාපිටිය මූකලාන; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: (අනවසරකරු: එස්. ඒ. සුහසිංහ, අංක 21 1/2 සැතැපුම් කනුව, සාලියවැව හංදිය); ප්‍රමාණය: හෙක් 0.0015.

3. කැබලි අංක 7449
ඉඩමේ නම: රනවරාපිටිය මූකලාන; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එස්. ඒ. ඩී. නිදර්ශිකා තුෂාරි, රනවරාපිටිය, සාලියවැව හංදිය; ප්‍රමාණය: හෙක් 0.0024.

4. කැබලි අංක 7450
ඉඩමේ නම: රනවරාපිටිය මූකලාන; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. පී. පෙරේරා, රනවරාපිටිය, සාලියවැව හංදිය; ප්‍රමාණය: හෙක් 0.0118.

5. කැබලි අංක 7451
ඉඩමේ නම:–; විස්තරය: මාර්ග (මා.සං.අ.); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:–; ප්‍රමාණය: හෙක් 1.1377.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 සැප්තැම්බර් මස 05 වැනි දින

පෙ.ව. 10.00 ට කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 ඔක්තෝබර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඒ. ඒම්. සී. එම්. ප්‍රේමසූරිය
ප්‍රාදේශීය ලේකම්,
කරුවලගස්වැව.

2013 අගෝස්තු මස 29 වැනි දින,
කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.